# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 අප්‍රේල්/මැයි/ජූනි

මානවශාස්ත්‍ර පීඨය

ප්‍රතිබිම්බ කලා - IMAT- E 3025

සිනමා සහ රූපවාහිනී මාධ්‍ය රසාස්වාදය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි          කාලය : පැය 03 යි

---

01. 'තේමාව' යනු කුමක්දැයි පැහැදිලි කොට, චිත්‍රපටවලට වස්තු විෂයවන තේමා වර්ග පිළිබඳ විග්‍රහයක් කරන්න.

02. රසිකයෙකු විසින් චිත්‍රපටයක් නැරඹීමට පොළඹවන කරුණු හා නැරඹීම ප්‍රතික්ෂේප කිරීමට තුඩුදෙන කරුණු මොනවා දැයි පරීක්ෂා කරන්න.

03. විචාරකයාගේ කාර්යභාරය පැහැදිලි කොට චිත්‍රපට විචාරකයකු සතු විය යුතු සුදුසුකම් මොනවා දැයි පෙන්වා දෙන්න.

04. "විචාරකයා යනු සිනමා කර්මාන්තයේ ප්‍රගමනයට අත්‍යාවශ්‍යම පුද්ගලයෙකි." සාකච්ඡා කරන්න.

05. විනෝදාස්වාදය අරමුණු කරගෙන නිපදවන වාණිජ චිත්‍රපට කලා නිර්මාණ වශයෙන් සලකා විචාරයට ලක් කිරීම සාධාරණ ද? ඔබේ අදහස් දක්වන්න.

06. සාර්ථක චිත්‍රපට විචාරයක් ලියනු පිණිස ඔබ අනුගමනය කරන විචාර රීතිය කුමක් ද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

07. රූපවාහිනී නාලිකාවල විකාශනය වන ටෙලි නාට්‍ය රසවින්දනයට හා විචාරයට බාධා පමුණුවන හේතු කාරණා පිළිබඳ විග්‍රහයක් කරන්න.

08. කලාත්මක තෘප්තිය යනු කුමක්දැයි පැහැදිලි කොට සිනමා නිර්මාණ රසාස්වාදයේ දී ප්‍රේක්ෂක මනසෙහි ජනිත විය හැකි අනෙකුත් තෘප්තීන් කවරේ දැයි විමර්ශනය කරන්න.

*********************************